# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2498/14 - 2026 ජූලි මස 22 වැනි බදාදා - 2026.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ**

**මීගමුව මහා නගර සභාවේ**

**සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොටගෙන මීගමුව මහා නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මීගමුව මහා නගර සභාවේ අංක 6 - පළහතුරේ කොට්ඨාසයට තේරී පත්වූ හීන්කෙන්ද මුදලිගේ දොන් රොබට් හීන්කෙන්ද මහතා අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ ක (30) කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම මීගමුව මහා නගර සභාවේ අංක 6 - පළහතුරේ කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා පට්ටන හෙට්ටිගේ දිනේෂ් සුලෝචන ප්‍රනාන්දු මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

මීගමුව මහා නගර සභාවේ තේරීම්භාර නිලධාරි විතාන අප්පුහාමිල්ලාගේ රවීන්ද්‍ර වික්‍රමසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් පට්ටන හෙට්ටිගේ දිනේෂ් සුලෝචන ප්‍රනාන්දු මහතා, මීගමුව මහා නගර සභාවේ, අංක 6 - පළහතුරේ කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

**ඩබ්ලිව්. ඒ. රවීන්ද්‍ර වික්‍රමසිංහ,**
තේරීම්භාර නිලධාරි,
මීගමුව මහා නගර සභාව.

2026 ජූලි මස 22 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය.
ගම්පහ.

EOG 07 - 0305


1A - PG 7830 — 04 (2026/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*